6.3.3 775 A දේවගොඩ, දේවගොඩ පාසල අසල, දේවතුඩුව පාර ගමන් කිරීමට නොහැකි ත්ත්වයෙන් පවතින බැවින් සභා අරමුදල් යොදවා ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා**

ශ්‍රී ලංකාවේ රබර් කිරි නිෂ්පාදනය කියන එකේදි ඇත්තටම ශ්‍රී ලාංකික ජනතාවට තේ රබර් පොල් තමයි මේ රටේ තිබුණු ප්‍රධානම වැවිලි තුන වෙන්නේ.ඒ මත තමයි ලංකාවේ ආර්ථිකය සකස් වෙලා තිබුණේ.නව විවෘත ආර්ථිකය සමග ආපු කර්මාන්ත ප්‍රතිපත්තිය නිසා කර්මාන්තවලට වැඩි අවධානයක් යොමුවෙලා ප්‍රධාන වගාවන් හැටියට තිබුණු මේ වගාවන් අභාවයට යන තත්ත්වයකට පත් කරලා.අද රටේ රබර් කිරි නිෂ්පාදනය ඉතාමත් ඛේදජනක තත්ත්වයට පත්වෙලා තියෙනවා.ඇත්තටම ලංකාවේ රබර් කිරි නිෂ්පාදනයේ දී කළුතර දිස්ත්‍රික්කය වැදගත් වෙනවා.මොකද කළුතර දිස්ත්‍රික්කයේයි රබර් කිරි නිෂ්පාදකයෝ වැඩි වෙන්නේ.එතනිනුත් කුඩා රබර් වතු හිමියන් විශාල වශයෙන් ඉන්නවා.අද කුඩා රබර් වතු හිමියන් දෙලක්ෂ පනස් දාහක් පමණ ශ්‍රී ලංකාව තුළ ඉන්නවා.මේ අය අද තියෙන තත්වය අනුව රබර් නිශ්පාදනය කරන ලංකාවේ කුඩා රබර් වතු හිමියන්ට හොඳ ජීවන තත්වයක් නැතුව ගිහින් තියෙනවා.මීට හේතුව වෙලා තියෙන්නේ රබර් කිරි පිටරටින් ගෙන්වීමයි.අද වෙනකොට රබර් කිරිවලට ගෙවන මිල පහත බැහැලා තියෙනවා.මීට හේතුව වෙලා තියෙන්නේ රබර් කිරි පිටරටින් ගෙන්වීමයි.අපේ රටට අවශ්‍ය දෙයක් නිසායි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ.මේ සම්බන්ධයෙන් රටේ ජනතාවට දැනුවත් කරනවා නම් මේක ඉතා වැදගත් යෝජනාවක්.අපි අපේ ගම්වල ඉන්න රබර් කිරි නිශ්පාදකයින්ගේ දුක මේ හරහා ප්‍රකාශ කරන්න ඕන.නැතිනම් අපේ අසරණ ගොවියන්ට ලැබෙන මිල ඉතාමත් අඩු තත්ත්වයක පවතින්නේ.ඒ නිසා සාවධානව මේ සම්බන්ධයෙන් කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

මගේ දෙවැනි යෝජනාව වශයෙන් ඉදිරිපත් කළේ අපේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ යෝජනා සම්මතයෙන් අත්හිටවනු ලැබූ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ දුරකථන දීමනාව මන්ත්‍රීවරුන් සඳහා නැවත ලබාදීමට කටයුතු කිරීම පිළිබඳව යි.ඇත්තටම මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ දුරකථන දීමනාව සුළු දෙයක් වුණත් මේ දුරකථන භාවිත කිරීම මන්ත්‍රීවරුන්ට ඉතාමත්ම බහුල වෙනවා.අපි කරන්නේ මේ රටට ජනතාවට සේවයක්.අද දුරකථන බිල ඉතාමත්ම ඉහල තත්වයකට පත්වෙලා තියෙනවා.ඒ නිසා මන්ත්‍රීවරුන්ට දුරකථන දීමනාව නොලැබීම අපට ප්‍රශ්නයක් වෙලා තියෙනවා.මම මේ සභාව නියෝජනය නොකළ දිනයක තමයි මේ යෝජනාව ඉදිරිපත් වෙලා සම්මත වෙලා තියෙන්නේ.ඇත්තටම අපේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඒ දුරකථන දීමනාව නැවතත් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.ඒ වගේම අපේ මන්ත්‍රීවරුන්ගේ යෝජනාවකින් සභා සම්මත කරගනු ලැබූ එම යෝජනාව අපේ මන්ත්‍රීවරයකුගේම යෝජනාවකින් නැවත වලංගු කරන්න පුළුවන් කියන එකයි මගේ අදහස වෙන්නේ.දැන් බේරුවල ප්‍රාදේශීය සභාවේ එහෙම දුරකථන දීමනාව තමන්ට ගෙවන දිමනාවටම එකතු කරලා ගෙවන බවක් අපිට දැනගන්න ලැබුණා.අපි භාවිත කරපු ප්‍රමාණයට පමණයි අපේ දුරකථන බිල ගෙවන්නේ.එ නිසා ජනතාව වෙනුවෙන් කරන සේවය සලකලා මේ සියලුම මන්ත්‍රීවරු වෙනුවෙන් නැවතත් එම දීමනාව ලබා දීමට කටයුතු කරන මෙන් මේ සභාවෙන් ඉල්ලා සිටිනවා.

මගේ තෙවැනි යෝජනාව වන දේවගොඩ පාසල අසල තියෙන පාරේ ගෙවල් දහයක් විතර තියෙනවා.ඒ යන මාර්ගය මුල් ස්ථානය ටිකක් අපහසු යි.සෝදාපාළුවට ලක්වෙලා තියෙනවා.ඒ වගේම මේ ප්‍රදේශයේ ඉන්නවා රෝද තුනේ බයිසිකලයකින් යන තනිවුන අසරණ පුද්ගලයෙක්.එයාට එතනින් තනිවම යන්න අමාරුයි,තව කෙනෙක් උදව් කළොත් පමණයි උඩට යන්න පුළුවන්.මම මීට පෙරත් මේ යෝජනාව ඉදිරිපත් කළා.මේ අවස්ථාවේ මම ගරු සභාවට යෝජනා කරනවා මේ ස්ථානයේ ඉතා ඉක්මනින් පිළිසකර කරලා දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හින්ටන් ගුණසිරි මහතා**

රබර් කිරි ආනයනය ගැන ජනතාවට ලොකු ප්‍රශ්නයක් තියෙනවා.මේ සේවකයන්ට වැටුප් ගෙවා ගැනීමේ අවශ්‍යතාවයකුත් තියෙනවා.නමුත් රබර් කිරිවලට ගෙවන මිලත් අඩු යි.එනිසා වැඩ කරන සේවකයන්ට වැටුප් ගෙවීම ලොකු ප්‍රශ්නයක්.දැන් රබර් කිරි ආනයනය කිරීම මේ රට තුළ බරපතළ ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ.රබර් කිරිවලින් යැපීමේ ජනතාවට ඒකෙන් අපහසුවක් වෙලා

තියෙන්නේ.ඒ නිසා මේක ඉහලට දැනුම් දීලා මේ පිළිබඳව පියවරක් ගන්නා මෙන් මමත් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදේශ් ලක්මාල් මහතා**

6.3.1 යෝජනාව කාලෝචිත යෝජනාවක්.මේ රට අද වැටිලා තියෙන තත්ත්වය තමයි මේ සියලුම දේට බලපාපු හේතුව වෙලා තියෙන්නේ.සියලු දේ පිටරටින් ගෙන්වා ලංකාවේ නිශ්පාදකයා,කුඩා ව්‍යාපාර කරන සියලු දෙනා දණින් වට්ටලා රට අරාජික බවට පත් කිරීමේ ප්‍රතිඵලය තමයි ඔබතුමා මේ දාපු යෝජනාව හරහා මට නම් පේන්න තියෙන්නේ.අපි මේ යෝජනාව මෙතනින් ඔබ්බට ගෙනියන එක හොඳයි.නමුත් මේක ක්‍රියාවට නැංවීම කවුරුන් කරයි ද?ඊට අමතරව රබර් ගස් ගලවලා කටුපොල් වගා කරපු එක තවත් හේතුවක්.ඒ ආරම්භයේ සිට අද වෙනකොට කටු පොල් නිසා ළිඳක ජලයවත් නැති තත්ත්වයක් පවතින්නේ.පෞද්ගලික ව රබර් කිරි නිෂ්පාදනය කරන ගොවියන්ට මිල පහළ යෑම ඇත්තටම කණගාටුදායක තත්වයක්.මේ සියල්ලටම හේතුව වශයෙන් මම නම් දකින්නේ මේ පවතින දේශපාලනය යි. මම නම් දකින්නේ මේ දේශපාලන ක්‍රමය වෙනස් විය යුතුමයි.එසේත් නොමැතිව මේ යෝජනා සඳහා මේ තියෙන පාර්ලිමේන්තුවෙන් කිසිදු සාධාරණයක් ඉටු වෙන්නේ නෑ කියන එකයි මගේ මතය වෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික මහතා**

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු වශයෙන් අපි මේ යෝජනාවට එකඟ වෙනවා.මේක කාලෝචිත යෝජනාවක් විතරක් නෙමෙයි.මේක ආර්ථික ක්‍රමයේ දී ඇති වූ අර්බුදයක්.පසුගිය කාල වකවානුව තුළ මේ රට පවත්වාගෙන ගිය ආර්ථික ක්‍රමයෙන් මේ රටේ දේශීය ආර්ථික ක්‍රමය විනාශ කරන්න දුරදිග නොබලා ගත්ත තීන්දු තීරණවල ප්‍රතිඵල මේ තියෙන්නේ.අද වෙනකොට මේ රටේ සමස්තයක් වශයෙන් සියලු දෙනාම පිළිගන්නවා මේ රට ආර්ථික වශයෙන් වෙනස් වෙලා තියෙන බව.මේ රටේ ජනමතයට සවන් දෙන්නේ නැති තීන්දු තීරණ ගත්තා.ඒ තීන්දු තීරණවල ප්‍රතිඵල හැටියට දේශීය ආර්ථිකය කඩාවැටිලා තියෙනවා.වැවිලි කර්මාන්තය කඩාවැටිලා තියෙනවා.රබර් කර්මාන්තය ගැන ඔබතුමා ඉදිරිපත් කරන මේ යෝජනාව රබර්වලට සීමා කරන්න එපා.පොදුවේ සියලු ම ආර්ථිකය වැටිලා තියෙන අවස්ථාවක,විශේෂයෙන්ම වැවිලි ආර්ථිකය වැටිලා තියෙන අවස්ථාවක සියලු ගොවීන් වෙනුවෙන් සහන සලසන්න මේ ආණ්ඩුව වෙත පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමා දරන උත්සාහය පිළිබඳ ව අපි සතුටු වෙනවා.මොකද අපි කවුරුත් රටට අයහපතක් කරන්න හිතාගෙන දේශපාලනයට ආපු මිනිස්සු නෙමෙයි.ඒ චේතනාව හොඳයි. හැබැයි සුදේශ් මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ පාර්ලිමේන්තුව ඇතුළේ මේ දේවල් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියන එක ප්‍රශ්නයක්.මේ රට ගෙන යන වැඩපිළිවෙළ යටතේ දේශීය ගොවියා විනාශ වෙලා.දේශීය වැවිලි කර්මාන්තය විනාශ වෙලා.අප රටේ ආර්ථිකය විනාශ වෙලා.ඔබතුමා මේ ප්‍රදේශවල ජනතාවගේ දුක හඳුනන දේශපාලනඥයෙක් වශයෙන් මේ යෝජනාව ගෙනත් තියෙනවා.අපි අද විශේෂයෙන්ම ආවේ ඔබතුමාගේ මේ යෝජනාවට ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු වශයෙන් මේ අදහස් දැක්වීම තුළ ඔබව අගය කරන්න යි,ඔබේ යෝජනාවට අපේ ස්තූතිය පළ කරන්නයි.මේ වන විටත් අපි දිස්ත්‍රික්ක කිහිපයක කුඩා රබර් වතු හිමියන් එකට ඒකරාශි කරලා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරලා තියෙනවා.නමුත් රජය ඇහුම්කන් දෙන බවක් නැහැ.කෙසේ නමුත් ඔබතුමා වැනි මන්ත්‍රීවරු මේ සම්බන්ධයෙන් උනන්දු වෙන බව රජයට පෙන්වීම තුළ සහනයක් දෙන්න කුමන හෝ ආකාරයක වැඩපිළිවෙළක් දියත් වෙන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**

මගේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා මිත්‍රානන්ද මන්ත්‍රීතුමාගේ යෝජනාවට පිටින් තමයි ගොඩක් කාරණා කතා කළේ.අපේ ප්‍රදේශය ගත්තාම ගොඩාක් තියෙන්නේ රබර් වතු. කළුතර දිස්ත්‍රික්කයේත් ගොඩාක් තියෙන්නේ රබර් වතු.මේ කතිකාවතට යොමු වෙන්නේ ගම් මට්ටමේ මිනිස්සුන්ට ගොඩාක් මුහුණ දීමට සිදු වෙලා තියෙන ප්‍රශ්නක්.අපේ ගම්වල ඉස්සර පවුල් රාශියක් රබර් කපලා ජීවත් වුණා.අද ඒ පවුල්වල බොහෝ අයට රැකියාවන් ගොඩක් අහිමි වෙලා තියෙනවා.ඒ වගේ රබර් ගස් කපලා අද වෙන්දේසි ඉඩම් බවට පත් කරලා.මේ සම්බන්ධයෙන් හොඳ ඉදිරි දැක්මක්

අවශ්‍ය වෙනවා.ඒකට නැවත මේ වගාවන් ස්ථාපිත කිරීම වැදගත් වෙනවා.ඒකට අවශ්‍ය ප්‍රතිපාදන රජය හරහා ලබා ගැනීමටයි මේ මන්ත්‍රිතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ.අපි බලන්න ඕන අපේ රබර් කිරි ගොවියාට සහනයක් ලබාගන්න මේ තුළ වැඩපිළිවෙළක් තියෙනවාද කියලා. මේකට වැඩපිළිවෙළක් සකසා දෙන්න ඕන.මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වගේම පාසල ආසන්නයේ දේවගොඩ දේවතුඩුව පාර හා සම්බන්ධයෙන් එතුමා කිව්වා.එතන අසරණ වුණු පුද්ගලයෙක් ඉන්නවා කිව්වා.මේ මාර්ගය හදන්නේ නැතුව ගමන් කරන්න අපහසුයි කිව්වා.පාර සෝදාපාළුවට ලක්වෙලා නිසා එය හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරමු කියන එක මතක් කරනවා.

දුරකථන දීමනාව සම්බන්ධ යෝජනාවේදී ඇත්තෙන්ම මම 2018 ඉඳන් මේ වෙනකම් මගේ දුරකථන දීමනාව ලබාගෙන නැහැ.ඉදිරියට ගන්නෙත් නැහැ.අද රටේ පවතින වාතාවරණයත් එක්ක මේක නොගන්න එක හොඳයි.අද රට තුළ ඉතා අමාරු තත්ත්වයක් පවතින්නේ.ඒ නිසා මේ මුදල්වලින් මේ මිනිස්සුන්ට ඊට වඩා ප්‍රයෝජනවත් කුමන හෝ දෙයක් වෙනවා නම් ඒකයි වටින්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

6.3.1 යෝජනාව යටතේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම පැහැදිලි අදහස් ගෙනාවා.මේක කාලෝචිත යෝජනාවක්. ඒ පිළිබඳ මම නැවත විග්‍රහ කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.නමුත් 6.3.2 යටතේ මම තමයි සභාවට මේ යෝජනාව ගෙනාවේ.සභාවක් හැටියට රටේ උද්ගත වෙලා තියෙන ආර්ථික අර්බුදයත් සමඟ මෙරටට යම්කිසි ආදර්ශයක් ගෙනා යෝජනාවක් මේක.නැත්නම් මේ දුරකථන දීමනාවෙන් මහා ලොකු දෙයක් නොලැබෙන බව අපි දන්නවා.හැබැයි මේ යෝජනාව අපි ගෙනාවේ සද්භාවයෙන්.මිනිස්සු කන්න බොන්න නැතුව ආර්ථික වශයෙන් ප්‍රශ්නවලට මුහුණ පාලා තියෙන අවස්ථාවේ මන්ත්‍රීවරු හැටියට අපි යෝජනාවක් ගෙනාවා මන්ත්‍රීවරුන්ට ලැබෙන දුරකථන දීමනාව සහ දිවා ආහාර වේල කාලෝචිත විදිහට නතර කරන්න කියලා.නැවත මේ යෝජනාව ගෙනත් මේ මොහොතේ සම්මත කරනවා නම් තවම මිනිසුන්ගේ ආර්ථික ගැටලු විසඳිලා නැහැ. අපේ මන්ත්‍රීධුරය පවතින අවසන් කාල සීමාවේ මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව මගේ නම් මනාපයක් නැහැ.මේ යෝජනාව ක්‍රියාත්මක වෙනවා නම් මම බෙදීමක් ඉල්ලනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**

අද වෙනකොට රබර් කර්මාන්තය අප රටෙන් ගිලිහිලා යමින් තියෙනවා.අපේ රටේ කෘෂිකර්මාන්තය දියුණු කරන්න පාලකයෝ සමත් වෙලා නැහැ.තාමත් කරගෙන යන්නේ අතීතයේ පැවති කෘෂිකාර්මාන්තය ම යි.පිටරටවල්වල ගොවීන්ට වැඩ කරන්න අවශ්‍ය යන්ත්‍රෝපකරණ, අවශ්‍ය සහයෝගය නොමිලේම ලැබෙනවා.නමුත් අප රටේ එහෙම නැහැ.රබර් තිබුනත් ඒ රබර් කපාගන්න මිනිස්සු හොයාගන්න බැහැ.තරුණ පරපුර රබර් වගාවට එන්න කැමති නැහැ.පිටරටවල අඩු පිරිවැයක් යටතේ නිශ්පාදනය ගන්න පුළුවන්.අපේ රටේ එහෙම නැහැ.අපේ රටේ පාලකයෝ මේ දේවල් පිළිබඳව හොයා බලන්න ඕන.මම හිතන්නේ මේක හොඳ යෝජනාවක්.

6.3.2 යෝජනාවේදී මම ඒකට එකඟ වෙනවා. එකඟ වෙන්න හේතුවක් තියෙනවා.මම මේ සභාවට ආව මන්ත්‍රීවරයෙක් වශයෙන් මගේ දුරකථන ගාස්තු මේ වෙන තෙක් අරගෙන නැහැ.ගමන් ගාස්තු ගන්නේත් නැහැ.අපි එහෙම කළේ ජනතාවට සේවයක් කරන්න ඒ මුදල් නිසි ආකාරව යොදවයි කියන බලාපොරොත්තුවෙන්. නමුත් මේ වෙනකොට පේන්නේ සභාවේ මුදල් නිසි ආකාරව භාවිත වෙන්නේ නැහැ.හොරා කන දේට අපිට හිමිවිය යුතු මුදල් දෙනවට වඩා හොඳයි ඒ මුදල අරගෙන අපි ප්‍රයෝජනවත් දෙයක් මිනිස්සු වෙනුවෙන් කරන එක.අපේ සභාවේ දුරකථන ගාස්තුව ගන්න අපි බිල ඉදිරිපත් කරන්න ඕන.අනිත් සභාවල දුරකථන ගාස්තු ගන්න වෙනම බිල ඉදිරිපත් කරන්න ඕන නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

බස්නාහිර පළාතේ කිසිම සභාවක බිල ඉදිරිපත් නොකර ගෙවන්නේ නැහැ.දකුණු පළාත් සභාවේ ප්‍රඥප්තියක් ඇති කරලා තියෙනවා.මහ මැතිවරණයට ඉදිරිපත් කළා මේක අපටත් ආදේශ කරලා දෙන්න කියලා.අපි කැමතියි ඒක කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිර්මාල් මහතා**

රබර් වගාව සම්බන්ධ යෝජනාව පිළිබඳව කවුරුත් අදහස් නොකර පැත්තකට අදහසක් යොමු කරන්න මම කැමැතියි.මේ අපේ පාලකයෝ සියල්ලන්ම පිටරටින් රබර් ගෙන්නුවා.දේශීය රබර් ගස විනාශ කරන තත්ත්වයට ගියා.රබර් ගහේ ආර්ථිකමය ලාභයට වඩා සමාජමය ලාභය බලන්න ඕන. පරිසරයට රබර් ගහෙන් ලැබෙන ලාභය අතිවිශාල යි.අපේ පාලකයන්ට දූරදක්නා ඥානයක් තිබුණා නම් තේ ගහට වඩා රබර් ගහයි රකින්න ඕනා.මේ අපරාදය නිසයි අද වෙනකොට නාය යන්නේ, විශාල ගංවතුර ඇති වෙන්නේ,පාරිසරික ප්‍රශ්න විශාල ප්‍රමාණයකට හේතු වුනේ මේ ඇතිවුන තත්ත්වය යි.අපේ නීති රීතිවලට අනුකූලව නම් මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රබර් වගා බිම් කට්ටි කිරීම වලක්වන්න තීරණයක් ගත්තා.

දූරකථන දීමනාව සම්බන්ධව මගේ පෞද්ගලික අදහසත් මේ වෙලාවේ ජනතාව ඉන්නේ ඉතා ඉහළ ආර්ථික අර්බුදයක.ඒ නිසා අපි එවැනි වකවානුවක දූරකථන බිලක් ඉල්ලීම පිළිබඳ ව දැඩි විරෝධතාව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා**

6.3.1 යෝජනාව සම්බන්ධවයි මම කරුණු ඉදිරිපත් කරන්නේ.මගේ ප්‍රාදේශීය සභා කාලසීමාව තුළ මම දූරකථන දීමනාව අරගෙන නැහැ.යෝජනාව ගෙනා මිත්‍රානන්ද මන්ත්‍රීතුමා සමඟ අපේ පෞද්ගලික ගැටළුවක් නැහැ.නමුත් මෙහෙම යෝජනාවක් දැම්මාම මේවා සභාවෙන් පිටට යනවා.විවේචනය කරනවා.වැරදි පූර්වාදර්ශයකට යන නිසා මම පෞද්ගලිකව මේ යෝජනාවට විරුද්ධ යි.වහාම මේ යෝජනාව ඉල්ලා අස්කර ගන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා**

මමත් දූරකථන දීමනාව අරගෙන නැහැ.6.3.1 යෝජනාව සම්බන්ධව අදහස් දක්වන්නේ.අද වෙනකොට මගේ කොට්ඨාශය වන අලුත්ගම්ගොඩ කොට්ඨාශය වටේ තියෙන්නේ රබර් වතු.මේ වනකොට ඒ රබර් ගස් පෙරලන්න යෝජනා කරලා තියෙන නිසා එකක්වත් කපන්නේ නැහැ.අපට බැරිද සභාවක් වශයෙන් ඒ රබර් වතු අයිති සමාගම සමඟ කතා කරලා ඒ නොකපන රබර් වතුවල තියෙන රබර් කිරි ටිකක් කපාගන්න ජනතාවට අවසරයක් අරගෙන දෙන්න.ආර්පිකෝ වතු සමාගම සමඟ සාකච්ඡා කරලා සභාව මගින් යෝජනාවක් දාන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා**

6.3.1 යෝජනාව යටතේ අදහස් දැක්වීමට බලාපොරොත්තු වෙනවා.මේක හොඳ යෝජනාවක්.නමුත් මේක යථාර්ථයක් බවට පත් කිරීමේ ප්‍රශ්නයක් තියෙනවා.ලංකාවේ රබර් හොඳම රබර් වුණත් ඒවාට නිසි මිලක්, අවශ්‍ය කරන නිසි ප්‍රවර්ධන වැඩසටහනක්, අවශ්‍ය කරන ආරක්ෂාවක් මේ රජයෙන් බලාපොරොත්තු වෙන්න බැහැ.මේ යෝජනාවට අපි සහයෝගය පළ කරන්න කැමති යි.

දෙවැනි යෝජනාව සම්බන්ධයෙන් මමත් කියන්නේ මේ මොහොතේ මමත් විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.රට ආර්ථික අර්බුදයක පවතින වෙලාවක මෙවැනි දීමනා ලබා ගැනීම සුදුසු නැහැ.මගේ දූරකථන ගාස්තුව මට අවශ්‍ය නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

6.3.1 යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වන්නේ.මේක කාලෝචිත සහ ඉතාම හොඳ යෝජනාවක්.රබර් කියන්නේ අතීතයේදී අප රටේ ප්‍රධාන ආර්ථික භෝගයක්.මේ අපනයන භෝගවල ආදායම මෑතක් වන කොට අඩුවීමත් සමඟ වෙනත් භෝග වගා කරන්න යොමුවුණා.මේ වෙනකොට දේශීය කර්මාන්ත සියල්ලටම මේ ඉරණම අත් වෙලා.මේ යෝජනාව මගින් රජයට පොඩි හෝ බලපෑමක් කරන්න හැකි වෙයි.

6.3.2 යෝජනාව සම්බන්ධව අත්හිටවපු දුරකථන දීමනාව ලබා ගන්න මේක වෙලාව නෙවෙයි.ඔබතුමාගේ යෝජනාවට විරුද්ධ වෙනවා නෙමෙයි.නමුත් රටේ ඇතිවෙලා තියෙන වාතාවරණය සමග පොඩි හෝ පූර්වාදර්ශයක් සපයන්න අපට හැකි නම් වටිනවා.මේ අවසාන මොහොතේ මේකෙන් පොඩි හෝ සහනයක් මිනිසුන්ට සලසන්න පුළුවන් නම් ඒකයි වැදගත් වෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් රම්සාන් මහතා**

රබර් වගාව පිළිබඳ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වන්නේ.නිදහසෙන් පසුව දේශීය වගාවන් නිසි පරිදි ශක්තිමත් කරලා තිබුණා නම් ජනතාව දුක් විඳින්න ඕන නැහැ.නමුත් මේ දේශීය කෘෂිකර්මාන්තය ගැන තව අවුරුදු කීයක් ඉදිරියට කතා කරන්න වෙයිද.මේකට වැඩපිළිවෙළක් අවශ්‍ය යි.නීති පද්ධතිය ශක්තිමත් කරන්න ඕන.වරදක් කළොත් දඬුවම් දෙන්න ඕන.ඒක දේශීය කෘෂිකර්මාන්තයේ ආනයන අපනයනයට සම්බන්ධ වෙනවා.ඒ නිසා දේශීය නිෂ්පාදන ශක්තිමත් කළා නම් ගැටලුවක් නැහැ.දුරකථන ගාස්තු සම්බන්ධ යෝජනාවේදී නම් අපි මෙතනට ආවේ ජනතාවට සේවය කරන්න.රටේ දියුණුවක් වෙනවා නම් මන්ත්‍රීතුමාලාට දීමනා පහසුකම් දුන්නාට කමක් නැහැ.රටේ තියෙන තත්වය අනුව මේවා ගන්න එක නුසුදුසු යි.මේ දුරකථන ගාස්තුව එකතු කරලා කොහෙ හරි දුෂ්කර ජනතාවට එකෙන් සේවයක් කරන්න පුළුවන් නම් මම හරි කැමැතියි.එලෙස ලබා දීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

මම මගේ දුරකථන දීමනාව ගත්තේ නැහැ.ඉදිරියටත් ඒක නොගෙන ඉන්නවා.රබර් කර්මාන්තයේ සම්පූර්ණ නිශ්පාදන කරන්නේ කළුතර දිස්ත්‍රික්කයේ යි.අපි කරන්න ඕන රබර් නිශ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් පිටරටින් ගෙන්වා හෝ ස්ථාපිත කරන එක.අපිට පුළුවන් රබර් කිලෝ එක ලක්ෂ දෙකකට තුනකට පිටරටට විකුණන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

රබර් කර්මාන්තය පිළිබඳ යෝජනාව සඳහා විවිධ අදහස් පළවුණා.අපි මේ පිළිබඳ කතා කළ යුතු තවත් දෙයක් තියෙනවා.රබර් කැපීමට පුහුණු ශ්‍රමිකයින් සඳහා වෘත්තීය ගරුත්වයක් සපයලා ඒක කරන්න ඕන.මේවාට විවිධ ගැටළු බලපානවා.ඉඩම් කට්ටි කිරීම සඳහා රබර් ඉඩම් ලබාදීම,ජනාවාසකරනය ආදී ගැටලු මේ සඳහා බලපානවා.

දුරකථනය ගැන මගේ මතය කිව්වොත් මේ සභාවේ මන්ත්‍රීවරු ඉන්නවා.ඒ අයට ජනතාවට විවිධ සේවාවන් සැපයීම සඳහා දුරකථන ඇමතුම් ලබා දීමට සිදු වෙනවා.අපි මේ රුපියල් දෙදහස් පන්සියයක් දාලා තිබුණේ දුරකතනයකට භාවිත කළ ප්‍රමාණය.මගේ අදහස නම් අපේ මේ මන්ත්‍රීවරු තමයි බිම් මට්ටමින් සියලු දෙනාටම පහසුකම් සපයන්නේ.අපි මේකට තීරණයක් ගමු.මට සභාපතිවරයා හැටියට සංයුක්ත දීමනාව ගන්න පුළුවන්.මම ඒවා ගන්නේ නැහැ.අද තියෙන තත්වය එක්ක අපි ගමන් වියදම ප්‍රතික්ෂේප කළොත් මොකද වෙන්නේ.අපි මේක සරලව සමාජයට පැහැදිලි කරන්න ඕන.මේ මන්ත්‍රීවරු තමයි හැමදේටම ජනතාවට පිහිට වෙන්නේ.අපි අපේ අගය ඇති කරලා සමාජයට කියලා මේ තීරණය ගමු.බෙදීමක් ඉල්ලා සිටින නිසා පැහැදිලි තීරණයක් අරගෙන ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා**

මම මේ යෝජනාව ඉදිරිපත් කළේ දුරකථන දීමනාවක අවශ්‍යතාවය ඇති නිසා නෙමෙයි.ඇත්තටම මේ ඉන්න මන්ත්‍රීවරුන් ඒ අයට ලැබෙන වරප්‍රසාදය ගත්තේ නැහැ කියලා ජනතාවගේ ප්‍රශ්න අඩු වෙන්නේ නැහැ.අපේ රටේ ඉහළ තැන්වල ඉන්න අය සියලුම වරප්‍රසාද ලබනවා නම් ඇයි මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට ඒ අයගේ වරප්‍රසාදය ලබා ගෙන දෙයක් කරන්න බැරි.මගේ තර්කය ඒකයි.රම්සාන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ තර්කය සාධාරණ යි.මන්ත්‍රීවරුන්ට මේක අවශ්‍ය නැතිනම් මම මේ යෝජනාව ඉල්ලා අස්කර ගන්නවා.මේකට බෙදීමක් අවශ්‍ය නැහැ.

පෙ.ව.11.30ට පමණ ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතාට සභාපති අසුන ලබාදී සභාවෙන් බැහැර විය.

<u>යෝජනාව</u>

**6.4 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

6.4.1 සිහිලැල්තැන්න I වෙන්දේසි ඉඩමෙහි පිහිටි වොලිබෝල් ක්‍රීඩාංගනයට පැමිණෙන අයවළුන් විසින් එහි ඇති පෙර පාසල් ගොඩනැගිල්ල හා භූමිය ප්‍රයෝජනයට ගැනීම නිසා නොයෙකුත් අලාභහානි වෙමින් පවතී.ඒ සඳහා ආරක්ෂිත වැටක් හා ගේට්ටුවක් දමා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

6.4.2 බොන්දුපිටිය ග්‍රාමයෙහි ඇති දැනට ක්‍රීඩාපිටිය ලෙස ප්‍රයෝජනයට ගන්නා භූමිය සභාවට පවරා ගැනීම පිළිබඳව,ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී නිරන්තරයෙන් සාකච්ඡාවට බඳුන් වූ අතර,සම්බන්ධීකරණ ගරු සභාපතිතුමාගේ නිගමනය අනුව,එම පවරා ගැනීම සම්බන්ධයෙන් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් කවරේද ?යන්න ගරු සභාවට පැහැදිලි කර දෙන මෙන් යෝජනා කරමි.

<u>තීරණය</u>

6.4.1 සිහිලැල්තැන්න I වෙන්දේසි ඉඩමෙහි පිහිටි වොලිබෝල් ක්‍රීඩාංගනයට පැමිණෙන අයවළුන් විසින් එහි ඇති පෙර පාසල් ගොඩනැගිල්ල හා භූමිය ප්‍රයෝජනයට ගැනීම නිසා නොයෙකුත් අලාභහානි වෙමින් පවතී.ඒ සඳහා ආරක්ෂිත වැටක් හා ගේට්ටුවක් දමා දෙන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.4.2 බොන්දුපිටිය ග්‍රාමයෙහි ඇති දැනට ක්‍රීඩාපිටිය ලෙස ප්‍රයෝජනයට ගන්නා භූමිය සභාවට පවරා ගැනීම පිළිබඳව,ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී නිරන්තරයෙන් සාකච්ඡාවට බඳුන් වූ අතර,සම්බන්ධීකරණ ගරු සභාපතිතුමාගේ නිගමනය අනුව,එම පවරා ගැනීම සම්බන්ධයෙන් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් කවරේද?යන්න ගරු සභාවට පැහැදිලි කර දෙන මෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ප්‍රියංකා දමයන්ති මහත්මිය**

පළමු යෝජනාව සම්බන්ධයෙන් කරුණු දැක්වීමේදී මේ ක්‍රීඩාංගණය පෙර පාසල සමීපයෙහි ඉදි වී ඇති නිසා එතන ක්‍රීඩා කරන්න එන ක්‍රීඩාලෝලීන් පෙර පාසල් භූමියේ එක් එක් අපද්‍රව්‍ය දාලා තියෙනවා.වතුර මෝටරයේ වයර් උඩට ඇදලා තියෙනවා.වැසිකිලි පද්ධතියට අලාභහානි සිදු කරලා තියෙනවා.මේවා දර්ශනය වීමෙන් කුඩා මනසවල් අවුල් වෙනවා.අපිට මෙහෙදී තිරසර සංවර්ධනය

යනුවෙන් නාස්තිය අවම කර ගනිමින් සංවර්ධනය ඇතිකර ගැනීමේ ක්‍රියාමාර්ගයන් හඳුන්වා දීලා තියෙනවා.මින් ඉදිරියේ දී එම සංවර්ධන ක්‍රියාවලියේ දී ඒ ඒ තත්වයන් අනුගමනය කරන මෙන් ඉල්ලා සිටිනවා.මෙම ස්ථානයේ කණ්ඩිය හැරීම නිසා බෑවුමක් නිර්මාණය වෙලා අනාරක්ෂිත තත්ත්වයකුත් ඇතිවෙලා තියෙනවා.ඒ නිසා එය කඩිනමින් ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

6.4.1 යෝජනාව සම්බන්ධව කතා කළොත් ඔබතුමා නිරන්තරයෙන් සම්බන්ධීකරණ රැස්වීම්වලට සහභාගි වුණා.එහිදී බොන්දුපිටිය ක්‍රීඩාංගනය සම්බන්ධයෙන් සාකච්ඡා වුණා.ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 16 වන වගන්තිය අනුව කටයුතු කරලා ගමේ සුභසාධනය වෙනුවෙන් ගම්වාසීන්ට නීත්‍යානුකූලභාවයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**
6.4.1 යෝජනාව සම්බන්ධව කතා කළොත් එම ස්ථානයේ ඉන්නේ පොඩි ළමයි.මේක ඔවුන්ගේ පෙර පාසල.එනිසා ක්‍රීඩාපිටියට එන අය නතර කරන්න නෙමෙයි එතුමිය ඉල්ලන්නේ.මේ පෙර පාසලට කිසිදු හානියක් නොකිරීමට සහ ඒ එන අයගෙන් වෙන හානිය නතර කර දෙන්නයි ඉල්ලා සිටින්නේ.එනිසා මේ පිළිබඳව කාරුණිකව සොයා බලන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**
තඹරුටිය පෙර පාසලේ ප්‍රජා ශාලා භූමිය හා සම්බන්ධ භූමිය නිරවුල් කරලා වැට ගහන මෙන් ඉල්ලා සිටිනවා.අවස්ථා ගණනාවක දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් මේකට ඉල්ලීම කළා.ඒ අය කිව්වා සභාවට පවරලා තියෙන්නේ කියලා.සභාවෙන් මේ කටයුතු සිදු කර දෙන මෙන් ඉතාමත් ම උවමනාවෙන් කියා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා**
තඹරුටිය ක්‍රීඩා පිටිය ලොකු ඉඩ ප්‍රමාණයක් සහිත ස්ථානයක්.මන්ත්‍රීතුමිය කිහිප වතාවක්ම මේ පිළිබඳව ඉල්ලා සිටියත් අද වන තෙක් කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කළේ නැහැ.එන්න එන්න මේ භූමි ප්‍රමාණය අඩු වෙලා අපට අහිමි වන තත්වයට පත්වෙලා තියෙන්නේ.හැකි ඉක්මනින් මේ පිළිබඳව සභාවේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා**
මටත් එවැනිම ගැටලුවක් තියෙනවා.මමත් මේ යෝජනාව සභාවට ඇවිත් තුන්වන වතාවටත් දාලා තියෙනවා.වලගෙදර උතුර ග්‍රාම සේවා වසමේ කොලනියේ සුසාන භූමියේත් මේ ගැටලුව ම තියෙනවා.ඒ සුසාන භූමියට අයත් භූමි ප්‍රමාණය වෙන් කරලා ලබා ගැනීමේ අවශ්‍යතාවය පවතිනවා. දැනටමත් වොලිබෝල් ක්‍රීඩා පිටියක් තියෙනවා.ඒකත් සභාවෙන් නඩත්තු වෙන්නේ.කිසිදු නඩත්තුවක් මේ වසර හතර පුරාවට සිදු වෙලා නැහැ.මම දන්න තරමින් සුසානභූමි සංවර්ධනයට ම වෙන ම සේවක මණ්ඩලයක් සභාවේ ඉන්නවා.නමුත් එම සේවකයින් කවදාවත් එම ස්ථානයට ඇවිත් නැහැ.මේ මාස කිහිපය ඇතුලත ඔබතුමාගේ මැදිහත් වීමෙන් ඒ පවතින භූමි ප්‍රමාණය සුසාන භූමිය සඳහා වෙන් කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
අපි මේ පිළිබඳ සොයා බලා කටයුතු කරනවා. කරවිට මන්ත්‍රීතුමා කිව්වා වගේ සොහොන් භූමි පිළිබඳ සියලුම බලතල සභාවට අයිතියි.අපිට මේ සභාවේ මන්ත්‍රීවරයෙක් යෝජනාවක් දැම්මාම කම්බි ගහලා වෙන් කරන්න,ඒක මනින්න,පිරිසිදු කරන්න,ඒකේ පස් පිඩැල්ලක් කැපීම පවා අපෙන් අවසරයක් නැතුව කරන්න බැහැ.මේ ඉල්ලීම පිළිබඳවත් අපි සොයා බලා කටයුතු කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන මහතා**
ක්‍රීඩා පිටි සම්බන්ධයෙන් කතා කරන කොට මතුගම මහජන ක්‍රිඩාපිටිය සම්බන්ධයෙන් පසුගිය සභා වාරයකදී ගැටලුවක් මතුවුණා.ලක්ෂ 13ක ගෙවීමක් කරන්න ගිහින් ඒක මතු වුනේ.මම දැනගන්න කැමතියි ඒ ගෙවීම දැනට කරලාද කියලා.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
අද උදේ ඒකේ කරලා තියෙන ප්‍රමාණයයි ඒ ගෙනත් තියන බඩු ප්‍රමාණයයි සියලුම දේ පිළිබඳව කතා කරලා කාර්මික නිලධාරීතුමියට ගණන් මිනුම් හදන්න කිව්වා.මේ ගිහින් තියෙන මුදලට අමතරව අසාධාරණයක් විදිහට යොදවලා විගණනයක් කිරීමට අවශ්‍ය ප්‍රමාණයට තියෙනවනම් විගණනයකට දාන්න අද උදේ භාර දුන්නා.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලිව නොඇසේ.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිර්මාල් මහතා**
මේක විගණනයක් සඳහා රජයේ විගණන දෙපාර්තමේන්තුවට භාර දෙන්න.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
භාර දීලලු තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන මහතා**
මම දැනගන්න කැමතියි මේ විමර්ෂණයට භාරදුන්න ලිඛිත ලියවිල්ලක් ඇතිනේ.මේ සභාවට ඉදිරිපත් කරන මෙන් ඉල්ලනවා.

(විමර්ශනය සඳහා ඉල්ලීම් කළ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.)

<u>යෝජනාව</u>

**6.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

6.5.1 ඇතුලත්මුදලිගම කොම්පෝස්ට් අංගනය තුළ ඇති ඉඩ ප්‍රමාණය තුළ පොහොර නිපදවීම අපහසු බැවින් ඊට යාබද ඉඩම සභාවට පවරා ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

6.5.2 මතුගම මහජන ක්‍රීඩා පිටිය තුළ ක්‍රීඩාගාරයක් ඉදි කිරීම සඳහා ක්‍රීඩා සමාජයක් ඉල්ලීම් කර ඇත.මෙම සභාවේ නීති රීතිවලට යටත් ව සහ සභාවේ පූර්ණ අයිතිය සහිත ව මාසික බදු පදනම මත බිම් කොටස ලබා දීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>තීරණය</u>

6.5.1 ඇතුලත්මුදලිගම කොම්පෝස්ට් අංගනය තුළ ඇති ඉඩ ප්‍රමාණය තුළ පොහොර නිපදවීම අපහසු බැවින් ඊට යාබද ඉඩම සභාවට පවරා ගන්නා ලෙස මෙම ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා විසින් ස්ථිර කරනු ලැබූවත් බොහෝ මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවය ප්‍රකාශ වූයෙන් යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.

6.5.2 මතුගම මහජන ක්‍රීඩා පිටිය තුළ ක්‍රීඩාගාරයක් ඉදි කිරීම සඳහා ක්‍රීඩා සමාජයක් ඉල්ලීම් කර ඇත.මෙම සභාවේ නීති රීතිවලට යටත් ව සහ සභාවේ පූර්ණ අයිතිය සහිත ව මාසික බදු පදනම මත බිම් කොටස ලබා දීමට මෙම ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.මිත්‍රානන්ද මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
දැන් අපි මේ වෙනකොට ගෙනත් තියෙනවා දවසකට ටොන් තුනහමාරක් පොහොර නිපදවන්න පුළුවන් යන්ත්‍රයක්.අපි ඒ පිළිබඳව සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.අපිට මේ කර්තව්‍යය කරගෙන යන්න මේ බිම් ප්‍රමාණය මදි.දවසට ටොන් තුනක් නිශ්පාදනය කරනවා කියන්නේ මේ නිශ්පාදනය කරන පොහොර ටික එකපාරට වෙළඳ සැලට එවන්න බැහැ.ඒ නිසා අපි ඒක එතන තැන්පත් කරලා කිලෝ ගාණට කොට්ට කරලා මෙහෙට එවන්න ඕනා.ඒක නිසා මේ භූමි ප්‍රමාණය අපට ලබාගත්තොත් තාවකාලිකව අපට මේ ඉඩම ලැබෙන තුරු කටයුතු කරන්න පුළුවන්.ඒ නිසා ඔබතුමාලාගේ අදහස දැනගන්න කැමතියි.අපි දවසට ටොන් අටක් කුණු ගෙනියනවා.මේ ටොන් අටේ කුණු ගොඩවල් අනුවක් තැන්පත් කරන්න වෙනවා.ඒක ක්‍රමානුකූලව තැන්පත් කළා ම දිනකට එක කුණු ගොඩක් ඉවත් වෙනවා.එක කුණුගොඩක් ඇතුල් වෙනවා.එතකොට මේක වට කරලා වැහුවම අපට ක්‍රමානුකූලව මේක කරන්න පුළුවන්.

අනිත් යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමාල දන්නවා මහජන ක්‍රීඩා පිටියේ හරියට 25දෙනෙක් වාඩිවෙලා තරගයක් නරඹන්න විදිහක් නැහැ.එනිසා දැන් ක්‍රීඩාගාරයක් ඉදිකිරීමට මතුගම ක්‍රීඩා සමාජයක් ඉදිරිපත් වෙලා තියෙනවා.අපේ පූර්ණ අයිතිය ඇතුව අපට බදු ගෙවලා අපේ බිම් ප්‍රමාණය එක්ක මේක කරන්න ඉල්ලීමක් කරලා තියෙනවා.මම යෝජනාව කරනවා මේ ක්‍රීඩාංගන ඉදි කිරීම සඳහා භූමිය ලබාදීම සුදුසුයි කියලා.ඔබතුමාලාට ඒ පිළිබඳව දැන් අදහස් දක්වන්න පුළුවන්.

මේක පවරා ගැනීමට ක්‍රම කිහිපයක් තියෙනවා.කුමන ක්‍රමයකින් පවරා ගත්තත් ප්‍රාදේශීය සභාවට තියෙන ඉඩම් පවරා ගැනීමේ අයිතිය පිට මේකට තක්සේරු වටිනා මුදලක් ගෙවන්න වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා**
මේක සින්නක්කර ඉඩමක්නේ.මේක මුදල් ගෙවලා පවරා ගන්න ඕන.ඉස්සෙල්ලත් මේ යෝජනාව ආවා.මම හිතන්නේ මේ ඇස්තමේන්තු මොනවට හරි මුදලුත් ගෙව්වා.දැන් ආපහු නැවත වාරයක් මුදල් ගෙවන්න ඕන මේක ඇස්තමේන්තු කරන්න.ලොකු මුදලක් මට මතක විදිහට ගෙව්වේ.මේවාට වග කියන්න කෙනෙක් නැහැ.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
නැවත පවරා ගැනීමක් නිසා කොහොමත් ගෙවන්න වෙනවා.පවරා ගන්න ගෙවීම් කළේ නැහැ.මැනුම් කටයුතු සඳහායි ගෙවීම් කළේ.මේක වුණේ අපට අක්කර දහයක ඉඩමක් ලැබෙනවා කිව්ව නිසා අපි මේක අතහැරියා.දැන් මේක උග්‍ර ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා**
මේ ඉඩම ගැනීමේදී අපට ගැටළුවක් නැහැ.මේක ගන්න පුළුවන්ද කියන එක බලලා ඕන මේක ගන්න.නැතිනම් තව පාරක් මේ සභාවේ සල්ලි වැය වෙන්නේ.මහජන මුදල් අපතේ යන එක මේකෙන් වෙන්නේ.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
අපි මේ පවරා ගැනීම් කරන්නේ නීත්‍යානුකූල ව ම යි.කොහොම කළත් අපේ නීති රීති අනුව ඉඩම පවරා ගැනීම් කරනකොට අපි එකේ තක්සේරු වටිනාකම ගෙවිය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන මහතා**
6.5.1යෝජනාව ඇත්තටම හොඳයි.මොකද කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් කමිටුවේ ඉන්න මන්ත්‍රීවරු පස්දෙනා නිවැරදි ලෙස තීරණ ගත් නිසා තමයි නිශ්පාදන ධාරිතාවය වැඩි වුනේ.මට මතකයි මේ යෝජනාව කලිනුත් සභාවට ආවා.මේක ලක්ෂ හැත්තෑවට තක්සේරු කළා.තක්සේරු වටිනාකම ලක්ෂ 70 වුනාට ඉඩමේ අයිතිකරුට ලැබෙන්නේ රුපියල් ලක්ෂ තිස් ගාණයි.එතන තමයි මේ ගනුදෙනුව නැවතුනේ.ඉඩම් හිමි කාරයා ඒකට විරුද්ධ වුණා.මේවා තමයි ඩීල්.මෙන්න මේ වගේ ඩීල්වලට තමයි අපි අකමැති.ඉඩම පවරා ගන්න,මිලදීගන්න ක්‍රියාවලිය හොඳයි.නමුත් අතයට

ගනුදෙනුවලට අපි විරුද්ධ යි.මේ යෝජනාවේ තනිකරම තියෙන්නේ අත යට ගනුදෙනුවක්.අනික ඔබතුමා කිව්වා කොම්පෝස්ට් අංගනයට ටොන් තුනහමාරක් හලන්න පුලුවන් මැෂින් එකක් ගෙනාවා කියලා.මේක ඇත්තටම සභාවට ලැබුණු පරිත්‍යාගයක්.

මේක කවුරුත් ඉල්ලලා ගත්ත එකක් නෙවෙයි.මේ කොම්පෝස්ට් අංගනය තියෙන්නේ ඔබතුමා ජීවත්වන කොට්ඨාසයේ.මේක ඇතුලේ තමයි හොරකම් සියල්ල සිදු වුණේ.එහෙමනම් ඔබතුමා මේකට වගකියන්න ඕන.ඇයි කිව්වොත් ඔබතුමාගේ කොට්ඨාශය තුළ සභාවේ භූමියක සභාවේ දේපල හොරකම් වෙනවා.ඒ වෙනුවෙන් ඔබතුමා වචනයක්වත් කතා කළාද.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
ඔබතුමා අසුබවාදීව හිතන එක ගොඩක් වැඩියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිර්මාල් මහතා**
මම රබර් කර්මාන්තය පිළිබඳව මගේ කතාවේදී කිව්වා මේ රටේ පාලකයෝ රබර් වගාවට සැලකුවේ නැහැ කියලා.ඒ ප්‍රතිවිපාක ලැබෙන්නේ අනාගතයට යි.ඒ වගේම තමයි ඇතුලත්මුදලිගම කියන්නෙත් මතුගම නගරය අවට ම තියෙන තැනක්.මේක වාණිජමය වටිනාකමක් තියෙන තැනක්.මෙම ස්ථානයේ කැළි කසළ එකතු කරන්න කවුරුන් හෝ යම් තීරණයක් ගත්තා නම් කොම්පෝස්ට් අංගනය මෙතනින් ඉවත් විය යුතු යි.නැතිනම් අනාගතයේ ලොකු ප්‍රශ්නයක් වෙන්නේ.මේක ඉවත් කරන්න ඕන තැනක තියනවනම් හදිසියේ ඉඩමක් ගන්න බලන්නේ ඇයි කියන ප්‍රශ්නයක් තියෙනවා.අක්කර දහස් ගණන් ඉඩම් තියෙනකොට ඇයි මේ කලබලේ මෙවැනි කටයුත්තක් කරන්නේ.මෙතැන දිගටම මේ කටයුත්ත කරගෙන යන්න හිතනවා නම් එය අනාගතයේ යම් විශාල ප්‍රශ්නයකට හේතුවක් වෙනවා.මේක අපට ගැටළුවක් නිසා මේ ස්ථානයෙන් මේක ඉවත් විය යුතු යි.ඒ නිසා මේ ගනුදෙනුව කිසිසේත්ම සිදු නොවිය යුතු බවට අපි කියනවා.මේ ගනුදෙනුවට මගේ දැඩි විරෝධයක් සහ ගනුදෙනුව කරනවා නම් බෙදීමකුත් ඉල්ලනවා. මොකද අපි මේ සභාවේ සම්පත් රකින්න ඕන.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
මේක ගනුදෙනුවක් නෙමෙයි.මේ වැරදි වැටහීමක් තියෙන්නේ.මේ කොම්පෝස්ට් අංගනය මෙතනින් ඉවත් කර වෙනත් තැනක සාදන තෙක් අපට විශාල කාලයක් යනවා.එතෙක් මේ ගේන අපද්‍රව්‍ය කොහෙද දාන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධම්මික නිර්මාල් මහතා**
මේ සභාව පත් වෙලා දැන් අවුරුදු හතරක් පහක් වෙනවනේ.මැතිවරණ කාලයේ ඔබතුමාගේ ප්‍රධාන සටන් පාඨයෙන් එකක් තමයි කොම්පෝස්ට් අංගනය ඔය ප්‍රදේශයෙන් ඉවත් කරන එක.මම,සීතා මන්ත්‍රීතුමිය සහ ඔබතුමා යන අපි තුන්දෙනාම කිව්වේ ඇතුලත්මුදලිගමින් කොම්පෝස්ට් අංගනය ඉවත් කරමු කියලා.දැන් ඒක ඉවත් කරනවා වෙනුවට එතන ස්ථාපිත කරන්න හදනවා.මීට පෙරත් ඔය ස්ථානය ම මිලදීගෙන ඕක කරන්න හැදුවා.ඒ නිසා පැහැදිලිව ම ඔතන තියෙන්නේ ගනුදෙනු රාමුවක්.මේ කොම්පෝස්ට් ව්‍යාපෘතියට ඔතන නුසුදුසු යි.මේ යෝජනාවට විරෝධතාවය ප්‍රකාශ කරමින් බෙදීමක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
මේක තාවකාලික ස්ථානයක්.ඕක අනිවාර්යයෙන්ම වෙන ස්ථානයකට අරන් යනවා.නමුත් ඒක තවම පරක්කුයි.දැන් මේක කරගෙන යන්න වෙන්නේ පාරේ කුණු දාලා.මේ ස්ථානය වාණිජමය වටිනාකමක් සහිත ස්ථානයක් බව අපි දන්නවා.මේ සභාව ගත්තාම කොම්පෝස්ට් අංගනය සම්පතක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා**

මේක තාවකාලික ස්ථානයක් නම් මම හිතන්නේ නැහැ දැන් මේ කරන්න යන්නේ තේරුමක් ඇති වැඩක් කියලා.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
මේ යෝජනාව දැම්මේ ඔබතුමාලගේ අදහස් ලබාගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන මහතා**
මේක කරනවා නම් හරියට කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා**
අපි කමිටුවකට පත්වෙලා කොම්පෝස්ට් අංගනය සම්බන්ධව දිගින් දිගටම සොයා බැලුවා.ඔබතුමා කිව්වා මේ නව යන්ත්‍රයෙන් ටොන් තුනහමාරක පමණ කසළ ප්‍රමාණයක් හලනවා කියලා.නමුත් මේ උපරිම ධාරිතාවය නෙමෙයි.උපරිම ධාරිතාවය ටොන් 5ක්. එතකොට දැන් කොට්ට තිහක් දවසට නිශ්පාදනය කරනවා.මේක අවුරුදු ගාණක් කරගෙන ආවා.මේ කුණු ටික කළමනාකරණය කරගන්න පුළුවන්.දැන් මේක කාර්යක්ෂම වෙලා තියෙන්නේ.ඔය තියෙන සම්පත්වලින් අපට නිසි ප්‍රයෝජනය අරගන්න පුළුවන්.මේ ස්ථානය වාණිජ වටිනාකමක් ඇති ස්ථානයක්.ඒ වගේම ඒ අසල ඇළ මාර්ගය පවා මේ හේතුවෙන් විනාශ වෙලා.ඒවා රැක ගන්න නම් මේ තියෙන භූමි ප්‍රමාණය ආරක්ෂා කර ගැනීම විනා තවත් ඉඩ අරගෙන එතන ස්ථාපිත කරන්න සූදානම් වෙන එක තේරුමක් නැහැ.කොම්පෝස්ට් අංගනය වෙනත් තැනකට ගෙනියන්න සැලසුමක් තියෙද්දි තව ඉඩමක් ගන්න මේ යෝජනාවට මගේ විරෝධතාව ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**
කොම්පෝස්ට් අංගනය සම්බන්ධ කමිටුවේ දී ඔය තියෙන කුණු ටික කළමනාකරණය කරගන්න ඔය තියෙන ඉඩම් ටික හොඳටම ඇති.ඒ වගේම ඔතන කොම්පෝස්ට් ක්‍රියාවලිය ක්‍රමවත් කරන්න ඕන. ඔය ටික තියාගන්න ක්‍රමවේදයක් හදන එක තමයි ඔතන තියෙන්නේ.මම හිතනවා රටේ තියන ආර්ථික ප්‍රශ්නත් එක්ක මිලදී ගැනීමකට යන්න හදන්නේ මොකද කියන ප්‍රශ්නයක් මතුවෙනවා.මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම චෝදනා කළා මේකට අත යට ගනුදෙනුවක් තියෙනවා කියන එක.මම කැමැතියි මේ අවස්ථාවේදී ඒ පිළිබඳවත් දැන ගන්න.ඒ පිළිබඳව අපටත් සැක නිසා මේ ඉඩම මිලදී ගැනීමේ දී සිදුවූ දේ කියා සිටින මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
මට තේරෙන විදිහට ඔබතුමන්ලා බොහෝ දෙනෙක් මේ ඉඩම මිලදී ගන්නවාට විරුද්ධ යි. ඔබතුමන්ලා වැරදියට තේරුම් ගන්නවා මේ තුළ අතයට ගනුදෙනුවක් සිදුවෙනවා කියලා.මේ යෝජනාව ගෙන ආවේ මම.මම මේ සභාව තුළ එහෙම අතයට ගනුදෙනු නොකරන බව මා පිළිබඳව දන්නා අය දන්නවා.ඔබතුමන්ලා මේ පිළිබඳ ව අදහස් දැක්වීම පිළිබඳ ව සතුටු යි.මේ යෝජනාවට අකමැති නම් මට මේක ඉල්ලා අස්කර ගන්න පුළුවන්.මම මේ යෝජනාව සංවර්ධන කමිටුවට දාන්න ලියලා තියෙනවා. එතකොට මම ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් වෙලා ඉද්දි ඉස්සෙල්ලාම සංවර්ධන කමිටුවේ මේ යෝජනාව දැම්මොත් මට ලැජ්ජයි.ඒ නිසයි ඉඩම මිලදී ගැනීම සඳහා මම මේ යෝජනාව දැම්මේ.මේක අපට ගත්තොත් අනාගතයේදී ඉතා වටිනවා.ඔබතුමන්ලාගේ තියෙන අදහස් නිසා මම මේ යෝජනාව ඉවත් කරගන්නවා.

යෝජනාව

**6.5 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

6.6.1 සෑම විදුලි පහනක් සඳහා ම සංකේත අනු අංකයක් ලබා දී හදිසි බිඳ වැටීම්වලදී දැනුම් දිය හැකි දුරකථන අංකයක් සඳහන් කොට නාම පුවරුවක් සෑම කණුවකම සවි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

තීරණය

6.6. 1 සෑම විදුලි පහනක් සඳහා ම සංකේත අනු අංකයක් ලබා දී හදිසි බිඳ වැටීම්වලදී දැනුම් දිය හැකි දුරකථන අංකයක් සඳහන් කොට නාම පුවරුවක් සෑම කණුවකම සවි කිරීමට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් ස්ථිර කරන ලදින් සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මම මේ යෝජනාව මීට පෙරත් සභාවට ඉදිරිපත් කරනු ලැබුවා.මේවා ලොකුවට මුදල් වැය වෙන යෝජනා නෙමෙයි.මතුගම ප්‍රාදේශීය සභාවේ කාර්යක්ෂමතාවය පිළිබඳ ව මේකෙන් ලොකු වටිනාකමක් ලැබෙනවා.මේකෙන් අදහස් වෙන්නේ සාමාන්‍යයෙන් කොට්ඨාශයක විදුලි පහනක් නිවී ගියාම බොහෝ වෙලාවට ඒ කොට්ටාශයේ මන්ත්‍රීවරයා හරහා තමයි මේ සභාවට ඒ පණිවිඩය එන්නේ.ඒ ප්‍රදේශයෙන් මන්ත්‍රීවරයාට පණිවිඩය ලැබුණේ නැති වුනොත් මාස තුන හතරක් හෝ ඊට වැඩි කාලයක් ඒ විදුලි පහන යාවත්කාලීන කරන්න හැකියාව ලැබෙන්නේ නැහැ.ඒක සභාවේ අකාර්යක්ෂමතාවය එළියට පෙන්වන අවස්ථාවක් වෙනවා.මම මේ යෝජනාව ගෙන එන්නේ දැනට අවුරුදු දෙකකට පෙර.ඒ අවස්ථාවේත් මේ යෝජනාව සම්මත වුණාට ඒක යථාර්ථයක් වුණේ නැහැ.මේකට ඇප් එකක් වගේ හදලා තිබුණා නම් කොට්ඨාශයෙන් කොට්ඨාශයට සෑම විදුලි පහනක් පිළිබඳව අවබෝධයක් ලැබෙනවා.ඒක විදුලි කාර්මික අංශයේ අයටත් පහසු යි.මම මේ නැවත නැවත මගේ පරණ යෝජනා ගෙන එන්නේ.මේ යෝජනාවවත් යථාර්තයක් බවට පත් කිරීමට කටයුතු කරවා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**

මේක ඇත්තටම හොඳ යෝජනාවක්.මම නියෝජනය කරන බොන්දුපිටිය කොට්ඨාශය ගත්තාම විදුලි පහන් සවි කරන සමහර තැන් සේවකයෝ දන්නෙ නැහැ.විදුලි පහන් තියන තැන් පිළිබඳ හරියටම සභාවේ වැඩසටහනක් තියෙනවා නම් මන්ත්‍රීවරයාටත් අවශ්‍ය නැහැ වාහනයේ නැගගෙන ගිහින් ඒ විදුලිපහන් පෙන්වා ගෙනයන්න.ඔබතුමාගේ විදිහත් වීමෙන් මේක අනිවාර්යෙන්ම කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා**

ඔය යෝජනාව හොඳයි.යෝජනාව පිළිබඳව දැන ගන්නයි මම මේ අහන්නේ.දැනට මතුගම ප්‍රාදේශීය සභාවේ හැම කොට්ඨාශයකම මන්ත්‍රීවරු කොයි ආකාරයෙන් හරි විදුලි බල්බ සවිකරලා තියෙනවානේ.හැබැයි අපි අද ඒ වෙනුවෙන් කිසිදු මුදලක් විදුලිබල මණ්ඩලයට ගෙවන්නේ නැහැ.ඒ නිසා මතුගම ප්‍රාදේශීය සභාවේ තියෙන සියලුම විදුලි පහන් පිළිබඳ වාර්තාවක් විදුලිබල මණ්ඩලයට යනවා.මේ වෙනකොට විදුලිබල මණ්ඩලය මාර්ගවල විදුලිබල්බ 50% ක් අඩු කරන යෝජනාවක් ගෙනත් තියෙනවා.මේ අංක කිරීම තුළ අපේ විදුලි බල්බ ගලවයි ද කියන සැකය පවතිනවා.එහෙම වෙන්නේ නැතිනම් නැති නම් අංක කරන එක හොඳයි.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**

එහෙම නීතිමය ප්‍රශ්නයක් තියෙනවා. හැම ප්‍රාදේශීය සභාවකම වර්ග කිලෝමීටර ගණන අනුව දාන්න පුළුවන් විදුලි බල්බ ප්‍රමාණයක් අපට දීලා තියෙනවා.මේ යෝජනාවේ ජනතාවට කාර්යක්ෂම

සේවයක් ඉටුවෙනවා.විදුලිබල මණ්ඩලයේ ප්‍රශ්නය බලලා මේක සාකච්ඡා මාර්ගයෙන් ඉදිරියට ගෙන යමු කියන එකයි මගේ අදහස වෙන්නේ.

**7. කාරක සභා වාර්තාව සලකා බැලීම.**
**නැත.**

**8. ආදායම් සහ වියදම් වාර්තා සලකා බැලීම.**
(2022 ඔක්තෝම්බර් මස ආදායම් සහ වියදම් වාර්තා සභාවේ දැන ගැනීම සඳහා සභාගත කරන ලදී.)

**9. පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා**
මම මේ අපේ මතුගම ප්‍රදේශයේ තියෙන උමා ගාර්ඩ්න් සංචාරක හෝටලය පිළිබඳව ඉල්ලීමක් කරනවා.මේ ප්‍රදේශයේ විදේශීය සංචාරකයන් බහුල ව පැමිණෙන විශාල හෝටලයක් මේක. ප්‍රදේශයේ ජනතාවට මේ තුළින් සුවිශේෂ වූ සේවාවන් සැපයෙනවා.මේ හෝටලය නිසා ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය සැලසෙනවා.විශේෂයෙන් ම අලුතින් කඩ පවා අද වෙනකොට ඉදි වෙලා තියෙනවා.එතනට යන්න අකාඩමුල්ල ප්‍රධාන මාර්ගයේ අඩි 600 ක පමණ ප්‍රමාණයක් තියෙනවා.ඒ මාර්ගය හොඳටම අබලන්.ඒ නිසා සභාව මගින් ඒ පාර නඩත්තු කරලා විදුලි බුබුළු තුනක් සමඟ දාලා දියුණු කරලා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
ඔබතුමාගේ යෝජනාව අපෙන් සිදුවිය යුතු සේවාවක් නිසා මේ පිළිබඳව සලකා බලන්නම්.මොකද අපිට මේකෙන් ආදායමක් ලැබෙනවා.අපට බදු ගෙවනවා.ඊට අමතර ව ඒ පාර භාවිත කරන සියලු දෙනාට සේවාවක් වෙනවා.මම ගරු සභාපතිතුමා දැනුවත් කරලා ඒ පිළිබඳ ව කටයුතු කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත කුලතුංග මහතා**
මතුගම පුස්සලමුල්ල ග්‍රාමසේවා වසමේ ගංහානි ලෑන්ඩ් සේල් නමින් ආයතනයක් තියෙනවා.පුස්සලමුල්ල ප්‍රදේශයේ පොදු ඉඩමට කොටසක් වෙන් කරලා තියෙනවා.ප්‍රදේශයට අත්‍යවශ්‍ය වෙන්නේ ක්‍රීඩාපිටියක්.මේ ආයතනයේ අය පොදු ඉඩම ගොඩ කරලා තියෙනවා.මම,තාක්ෂණ නිලධාරි මහතා සමගින් පරික්ෂා කළා.ඒ අයගෙන් ඉල්ලීමක් කළා අපට මේ සඳහා මුදලක් ලබා දෙන්න කියලා.අපේ සභාවේ කාර්මික නිලධාරීතුමා ගිහිල්ලා මේක ඇත්තමේන්තු ගතකළා.ඇස්තමේන්තුගත කළාම ඒ අය පරිත්‍යාගයක් විදිහට මේ ක්‍රීඩා පිටිය හදන්න කියලා අපේ සභාවට මුදල් දෙනවා.පුස්සලමුල්ල සුපර් ලෑන්ඩ්ස්" කියලා ක්‍රීඩා සමාජයක් තියෙනවා. දැන් ඒ සමිතියේ තරුණයෝ කියනවා ක්‍රීඩා පිටිය හදන්න දෙන මුදල ඒ සමිතියට ලබා දෙන්න කියලා.සභාවට දෙන එක වැරදි විදිහට යන නිසා ක්‍රීඩා සමිතියට මේක දෙන එක හොඳ බවයි මමත් කියන්නේ.අපි සභාවක් වශයෙන් පිට්ටනිය කපන්න ටිපර් රථය ලබා දීමට සහ පිට්ටනියේ පස්වලින් එහා පැත්තේ තියෙන පාර පස් දමා ගොඩ කරලා හදන්න යෝජනා කරනවා.මේ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන්න.

මෙම ඉල්ලීම සඳහා සභාවේ මන්ත්‍රීවරුන් අතර විරෝධතාවයක් නොවූ හෙයින් සභා අනුමැතිය ලැබිණි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**
අපේ සභාවේ වාර්ෂික අයවැය දෙවන වර ඉදිරිපත් කළා.අපිට දැනගන්න කාරණා දෙකක් තියෙනවා.මන්ත්‍රීවරයෙක් සභාවට පැමිණිය යුතු වෙලාවක් තියෙනවද?

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
තියෙනවා.උදේ දහයට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග මහතා**
මම මේ චෝදනාව ඉදිරිපත් කරන්නේ ලේකම්තුමියට.මේ ආපු මන්ත්‍රීවරු නම් ලැයිස්තුවේ නම් අත්සන් කරන්නත් කලින් ඔබතුමිය ඒකට අවසර දුන්නා.ඡන්දය පවත්වන වෙලාවෙදි කවුරුත් පොතේ නම අත්සන් කරලා නැහැ.අපි නම් අත්සන් කරන්න කලින් තමයි ඔබතුමිය අවසර දුන්නේ.ඒක සම්පූර්ණ වැරදි වැඩක්.ඔබතුමිය වගකිව යුතු නිළධාරියෙක් වශයෙන් ඒකට ඉඩ දීපු එක පිළිබඳ මුලින් ම මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

දෙවැනි වශයෙන් අපේ සභාවේ මේ දවස් වල කුලී පදනම මත මෝටර් ග්‍රේඩරයක් අරගෙන තියෙනවා.එය ගන්න අවස්ථාවේ එහි ආරම්භක මීටරය සභාවට ඉදිරිපත් කළේ නැහැ.මම අහලා තියෙන විදිහට කුලී පදනම මත මෝටර් ග්‍රේඩරයක් ගත්තා නම් ඒකේ මීටරය සභාවට ඉදිරිපත් කරන්න ඕන.මොකද සභාවේ සල්ලි මේ ගෙවන්නේ.නීත්‍යානුකූලව ඒ වැඩේ වුනේ නැති නිසා ඒක දැනගන්න ඕන.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
එහෙම දෙයක් වුනා නම් අපි ඔබතුමියට අවවාද කරනවා.මීටරය අර ගන්නේ නැතුව මේකේ ඉන්න කාර්මික නිලධාරීන් යන්ත්‍රයක් මේකට දාන්න දෙන්නේ නැහැ.අපි කාර්මික නිලධාරීන්ගෙන් මීටරය අරගෙන දැනගැනීම පිණිස මන්ත්‍රීතුමාට ඉදිරිපත් කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා**
ක්‍රීඩාපිටියේ ක්‍රීඩාගාරයක් ඉදිකිරීමට අදහස් කිරීමේ ඔබතුමාගේ යෝජනාවේ ඒ ක්‍රීඩා සමාජයේ සහ ලිපි ලේඛනවල තොරතුරු ටික ඉල්ලා සිටියා.මම මේ යෝජනාව ගෙන ඒම පිළිබඳ ව මුලින් ම ස්තුතිවන්ත වෙන්න ඕන.මේ ක්‍රීඩාපිටියේ ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන නිසා මේක ඉදිකරන්නේ කොහේද යනාදී තොරතුරු දැනගන්න අවශ්‍ය යි.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
මේ ක්‍රීඩාපිටියට ක්‍රීඩාංගණයේ සිට අවම දුර මීටර් 65ක් තියෙන්න ඕන.ඉතින් මේ ක්‍රීඩාපිටියේ වටේම මීටර් 65ක් නැහැ.මේක ඉදිකරන්න යන තැන මීටර් 72ක් තියෙනවා.ඒ මීටර් 72න් මීටර් 65ක් ඇරලා ඉතුරු ටික දෙනවා.දැන් අපි මේකේ නියම භූමි ප්‍රමාණය අරගෙන තියෙන්නේ.මේකට විශාල ගාණක් යන නිසා අපි මේක ඒ ක්‍රීඩා සමාජයට භාර දෙනවා.හැබැයි,මේකේ සම්පූර්ණ අයිතිය යතුරු ක්‍රීඩාගාරය පිළිබඳ අයිතිය බදු කුලිය ආදී සියල්ලක්ම සභාවට යෙදෙන විදිහට තමයි යෝජනාව දාලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන මහතා**
මේ සභාවේ අපි ඒකමතිකව කමිටු දෙකක් පත් කළා.ඒ කමිටු දෙක නැවත කැඳවන මෙන් යෝජනා කරනවා.ඊයේ අයවැය අවස්ථාවේ සභාවක නොවිය යුතු සිදුවීම් කිහිපයක් වුණා.අපේ පැත්තෙන් යම් කිසි දෙයක් වුණා නම් සමාව ඉල්ලනවා.ලේකම්තුමිය ගත්ත ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ඇත්තෙන්ම ප්‍රශ්නයක් තියෙනවා.නිලධාරියකුට දේශපාලන පක්ෂයක් නියෝජනය කරන විදිහට සභාවක හැසිරෙන්න බැහැ.මේ වෙනුවෙන් අවශ්‍ය කරන පියවර අපි ගන්නවා.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
අංක 215 පනත යටතේ මම නිලධාරියා සමග ඉන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන මහතා**
මම දන්න හැටියට මේ කාලයේ ව්‍යාපෘති ආරම්භ කරන්න බැහැ කියලා චක්‍රලේඛන රජයෙන් ගහලා තියෙනවා.කිසිදු සංවර්ධන කටයුත්තකට මුදල් යොදවන්න එපා කියලා තියෙනවා.දැන් ඔබතුමාලා දාන යෝජනා ලබන සතියේ ආරම්භ කරනවා,ඊළඟ සතියේ ආරම්භ කරනවා කියනවා.කොහොමද එහෙම වෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා**
මේ වෙනකොට ලක්ෂ සීයක් වෙන් කරලා තියෙනවා සභාවල්වලට වැඩ කරන්න.

**ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන මහතා**
පසුගිය දිනවල මෝටර් ග්‍රේඩර්යක් යොදාගෙන නිසි ප්‍රමිතියකින් තොරව මාර්ගවල පස් කපලා මාර්ග පුළුල් කරලා තියෙනවා.ඒකට විශාල මුදල් ප්‍රමාණයක් යොදවලා ප්‍රමිතියකින් තොරව ඡන්ද ලබා ගැනීම සඳහා මේ දේවල් කරලා තියෙන්නේ. තාක්ෂණ නිලධාරීන් යොදවලා මේ පිළිබඳව සොයා බලන්න.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
ප්‍රාදේශීය සභාවේ නඩත්තු කටයුතු සඳහා මුදල් වෙන් කරලා තියෙන්නේ.නඩත්තු කටයුතු කරගෙන යන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා**
මෝටර්ග්‍රේඩරයක් ගේනකොට මේ සභාවේ යෝජනා කීයක් දැම්මද මේක ගෙන එකට.ඒ වෙලේ මේ යෝජනාවලට කවුරුවත් විරෝධතා එල්ල කළේ නැහැ.අපේ පාරවල් මෝටර්ග්‍රේඩරයක් නොදා ශුද්ධ පවිත්‍ර කරන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබුණේ.

එළියේ වැරදි පූර්වාදර්ශයකට යනවා.මේ සභා වාරයේදී හෝ ඊට පෙර සභා වාරයකදී සැලසුම් කමිටු දීමනාවට විරුද්ධව මම කතා කළා.නමුත් එම දීමනාව මම නවත්තන්න කිව්වේ නැහැ.මේ කමිටුවට නිලධාරීන් කීයක් ඉන්නවද ඒ අය කවුද කියලා ප්‍රශ්නයට විසඳුමක් දෙන්න ඕන නිසා මම ප්‍රශ්න කරනවා. අපේ සභාවල විතරයිලු සැලසුම් කමිටු දීමනාව නොගෙවන්නේ.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
සභාපතිතුමා ලේකම් කළුතරින් එන නිලධාරියා ඉන්නවා.අපේ තාක්ෂණ නිලධාරීන් හතරදෙනා සහ විෂය කරන නිලධාරිනිය ඉන්නවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා**
එතකොට දැන් එක නිළධාරිනියයි එළියෙන් එන්නේ.හතක් හෝ අටක් මේකේ ඉන්නවා.මේ වෙද්දි ගෙවල් දොරවල් හදන එක අඩුවෙලා තියෙනවා.මට මේක ගෙව්වට ප්‍රශ්නයක් නැහැ.මම මේ කතා කරන්නේ මම මේකට විරෝධතාවයක් දැක්වුවා කියලා පිට ගිහින් තියෙන නිසා.මේක ගෙවන්න අවශ්‍යතාවයක් තියෙනවා නම් මුදල් ගෙවන්න අද සම්මත කරන්න.මොකද මට ගැටළුවක් නැහැ.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
අපි මේක ලබන සභාවට දාලා ගෙවීම් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**
අයවැය ඡන්දය වෙලාවෙදි අපි පළමු වර අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළා.එතනදී අපි මේ අයවැය ක්‍රියාත්මක කිරීමේ දී පරිපාලනයේ යම්කිසි ගැටලු තියෙනවා කියලා කිව්වා.ඒ ගැටළු නිවැරදි කර ගන්නයි දැනුවත් කිරීමක් කළේ.මේ අයවැයට පක්ෂව ඡන්දය දෙන්න කීයක් මුදල් ලැබුණද කියලා නිර්නාමික දුරකථන ඇමතුම් ආවා.මම මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම අයවැයට පක්ෂව ඡන්දය දෙන්න එක රුපියලක්වත්,එක කඩයක්වත් අරගෙන තියෙනවා නම් හෝ වෙනයම් අල්ලසක් අරගෙන තියෙනවා නම් ඒ බව ඔප්පු කළොත් මම හෙට මේ මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වෙන බව ප්‍රකාශ කරනවා.අපිට අයවැය ක්‍රියාත්මක කිරීමේ පරිපාලන ගැටලු නිරාකරණයට නෙළුම් මාවතේ පක්ෂ කාර්යාලයට කැඳවලා සාකච්ඡා කළා.එහිදී තමා අතින් යම් යම් වැරදි අඩුපාඩුකම් සිදු වුණ බව සභාපතිතුමා පිළිගත් නිසා සහ ඒවා ඉදිරියේ දී නිවැරදි කර කටයුතු කරන බවට එතුමා පොරොන්දු වන නිසායි අපි අයවැයට පක්ෂව ඡන්දය ලබා දුන්නේ.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
බොහොම ස්තූතියි ඔබ වහන්සේට.අල්ලස් මුදල් සම්බන්ධව ප්‍රකාශ කළා.මේ ඡන්දය විමසීමේ කටයුත්තේ දී කිසිම මන්ත්‍රීවරයෙක් අපේ මුදල්වලට නෙමේ අවබෝධයෙන් එම ඡන්දය දුන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ කරවිට මහතා**
පලමු වර අයවැය පරාජය වීමෙන් පසු ව කිසිදු සංශෝධනයකින් තොරව තමයි දෙවැනි අයවැය සම්මත කර ගනු ලැබුවේ.ඒ නිසා පළමුවර අයවැයට විරුද්ධ වූ මන්ත්‍රීවරයෙක් වශයෙන් මගේ තීන්දුව වෙනස් කරන්න මට කිසිදු අයිතියක් නැහැ.ඒ නිසයි මම අයවැයට පක්ෂව ඡන්දය නොදුන්නේ.පලමුවර මෙන් ම දෙවනිවරත් පක්ෂව ඡන්දය ලබා නොදීමට ඍජු තීරණයක සිටීම පිළිබඳව සතුටු යි. නමුත් මම අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ නිසා මගේ කොට්ඨාශයට යම්කිසි අසාධාරණයක් වෙනවා නම් අපි ඒ වෙනුවෙන් නැඟී සිටිනවා.

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
සභාව සතු වාහන රක්ෂණය කිරීම හා සම්බන්ධ ව මීට පෙර සභා අවස්ථාවේ දී සාකච්ඡා කළ කරුණු අනුව සණස රක්ෂණ සමාගමේ නියෝජිතයෙකුට එම රක්ෂණය හා සම්බන්ධව මන්ත්‍රීතුමාලාට දැනගැනීමට අවශ්‍ය කරුණු අසා දැන ගැනීම සඳහා එන්න කිව්වා.ඒ පැහැදිලි කිරීම සඳහා ආරාධනා කරනවා.

(සණස රක්ෂණ සමාගමේ අදාල නියෝජිතයා පැමිණ රක්ෂණය හා සම්බන්ධ ව අවශ්‍ය තොරතුරු පිළිබඳ ව මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී .)

**ගරු සභාපති මද්දුමගේ දොන් අතුල මහතා**
එහෙනම් අපි මේක සණස රක්ෂණ සමාගමට ලබා දීම පිළිබඳ ව ඔබතුමන්ලාගේ විරුද්ධත්වයක් නෑ නේද?

ඒ අනුව සභාව සතු වාහන රක්ෂණය කිරීම සඳහා සණස රක්ෂණ සමාගමට ලබා දීමට මන්ත්‍රීවරු සියලු දෙනා විසින් තීරණය කරන ලදී.

න්‍යාය පත්‍රානුකූල ව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසු මහ සභාවේ කටයුතු ප.ව.1.50ට පමණ අවසන් විය.